# වයඹ පළාතේ 1994 අංක 03 දරණ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය

(වයඹ ආණ්ඩුකාරවරයා අනුමතිය දුන් දිනය : 1994.12.16)

වයඹ පළාතේ 1990 අංක 08 දරණ මුදල් ප්‍රඥප්තිය යටතේ එකතු කරන ලද මුද්දර ගාස්තු, වයඹ පළාතේ පළාත් පාලන ආයතන වලට හැරවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

**ලුහුඬු නාමය**

1. මේ ප්‍රඥප්තිය වයඹ පළාතේ 1994 අංක 03 දරණ මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම ප්‍රඥප්තියට ආණ්ඩුකාරතුමාගේ අනුමතිය ලැබීමෙන් පසු එය ක්‍රියාත්මක වේ.

**මුද්දර ගාස්තු**

2. වයඹ පළාතේ 1991 අංක 2, 1991 අංක 4 හා 1992 අංක 01 දරණ ප්‍රඥප්ති වලින් සංශෝධිත වයඹ පළාතේ 1990 අංක 08 දරණ මුදල් ප්‍රඥප්තිය යටතේ පළාත් සභාව විසින්, වයඹ පළාතේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත පිහිටි යම් නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන් වූ යම් සාධන පත්‍රයක් වෙනුවෙන් යම් මුද්දර ගාස්තුවක් අයකර, එකතු කර, වයඹ පළාතේ පළාත් සභා අරමුදලට ගෙවා ඇති අවස්ථාවක, පළාත් සභාව විසින් ඒ මුද්දර ගාස්තුව අයකර, එකතු කරනු ලැබුවේ යම් නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන් ඒ නිශ්චල දේපල පිහිටා ඇත්තේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාවක් ඇතුළතද, ඒ පළාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා විසින් ඉහත කී පරිදි ඒ මුද්දර ගාස්තුව අයකර, එකතු කරන ලද වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින සිට අවුරුදු 05 ක් වූ කාලසීමාවක් ඇතුළත, වයඹ පළාත් අමාත්‍ය මණ්ඩලයේ මුදල් පිළිබඳ විෂය භාර අමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් හිමිකමක් ඉදිරිපත් කරන ලද විට, පළාත් සභාව විසින් ඒ පළාත් පාලන ආයතනයට ඒ මුද්දර ගාස්තුවේ මුදල හැරවිය හැකිය.

**රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගේ සහතිකය.**

3. 2 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද කිසිම හිමිකමක්, ඒ හිමිකමෙහි සඳහන් කරන ලද මුද්දර ගාස්තු ගෙවීම පිළිබඳව, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් ඔහු වෙනුවෙන් නම් කරන ලද වෙනත් යම් නිලධරයකු විසින් සහතික කරන ලද, උපලේඛනයක් ඒ හිමිකම සමඟ ඉදිරිපත් කරනු නොලැබුවහොත්, වලංගු නොවන්නේ ය.

02 / .....

අර්ථ නිරූපනය 4. මේ ප්‍රඥප්තියෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, ප්‍රධාන පරිපාලන නිලධාරියා යන්නෙන්;

(අ) මහ නගර සභාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් එහි නාගරික කොමසාරිස් වරයා; සහ

(ආ) නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් එහි ලේකම්වරයා

අදහස් වේ.

පළාත් පාලන ආයතනය යන්නෙන්, යම් මහ නගර සභාවක් නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි සභාවක් විසින් ක්‍රියාත්මක කරන සහ ඉටු කරන බලතල වලට, කාර්ය වලට සහ කර්තව්‍යවලට අනුරූපී වන හෝ සමාන වන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම සඳහා පිහිටුවනු ලබන වෙනත් යම් අධිකාරියක්ද ඊට ඇතුළත් වේ.

ආධාන පත්‍ර යන්නෙහි, 1990 අංක 08 දරණ වයඹ පළාතේ මුදල් ප්‍රඥප්තියේ ඇති අර්ථයම ඇත්තේ ය;

පළාත් සභාව යන්නෙන්, ශ්‍රී ලංකා ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව අදහස් වේ.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල පාඨය බලපැවැත්විය යුතු බව. 5. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර අනනුකූලතාවක් ඇති වූ විටක, සිංහල භාෂා පාඨය බල පවත්වන්නේ ය.